# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2262/52 - 2022 ජනවාරි මස 15 වැනි සෙනසුරාදා - 2022.01.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත මගින් වරින් වර සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මා විසින් මේ නියමය මගින්,

1. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත එකී පනතේ තුන්වන වගන්තිය ප්‍රකාරව සතුවී ඇත්තාවූද, මේ නියමයේ උපලේඛනය මගින් නිශ්චිතව දක්වා ඇති කෘෂිකාර්මික ඉඩම් කොටස් එකී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 (1) ආ ආ වගන්තිය ප්‍රකාරව 1978 අංක 4 දරන පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත විකිණීමෙන් පවරා දෙනු ලැබේ.
2. ඉහත කී විකිණීම සඳහා මුදල් ප්‍රතිෂ්ඨාව වශයෙන් රුපියල් 61,000,000/- (රුපියල් මිලියන හැට එකක) මුදල පහත උපලේඛණ ගත ඉඩම් වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා ඇත.

| *උපලේඛන* | *ඉඩමේ නම* | *පිඹුරු අංකය* | *කැබලි අංක* | *ප්‍රමාණය*<br>*අක්කර රූඩ් පර්චස්* |
|---|---|---|---|---|
| අංක 01 | පුන්නෙයිකුඩා තෝට්ටම් | මූලික පිඹුරු මඩ/3067 | 1,4 | 55 01 05.9 |

**සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන,**
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 10 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර" ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.


1A - G 35830 -13 (2022/01)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 වන උපලේඛනය - පුන්නෙයිකුඩා තෝට්ටම්

**ඉඩමේ විස්තරය** - නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුන්නෙයිකුඩා ගමේ පිහිටි පුන්නෙයිකුඩා තෝට්ටම් නමැති ඉඩම විශේෂ්‍ය අංක මඩ/13 යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. මෙම ඉඩමට අදාළ සර්වේයර් ජනරාල් විසින් 2021.01.02 දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු මඩ/3067 දරන පිඹුරෙහි පහත සඳහන් කැබලි හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්ව,

**(01) කැබලි අංක 01**

*ප්‍රමාණය* - අක්කර 39 රූඩ් 2 පර්චස් 7.0 (හෙක්ටයාර් 16.0025)
*උතුරට* - මූලික පිඹුරු මඩ/3017 කැබලි අංක 1 සහ තලවයිකාඩු ඉඩම
*නැගෙනහිරට* - තලවයිකාඩු ඉඩම
*දකුණට* - තලවයිකාවු ඉඩම සහ කැබලි අංක 02
*බටහිරට* - මූලික පිඹුරු අංක මඩ/3017 හි කැබලි අංක 1, 2 සහ 3 ද

**(02) කැබලි අංක 04**

*ප්‍රමාණය* - අක්කර 15 රූඩ් 2 පර්චස් 38.9 (හෙක්ටයාර් 06.3709)
*උතුරට* - මූලික පිඹුරු මඩ/3017 කැබලි අංක 3, 4 සහ 6 ද
*නැගෙනහිරට* - කැබලි අංක 3 සහ තලවයිකාඩු ඉඩම
*දකුණට* - භූලක්ෂණාත්මක පිඹුරු අංක 298482 සහ 174579 හි කැබලි අංක 5 සහ තලවයිකාඩු ඉඩම
*බටහිරට* - භූලක්ෂණාත්මක පිඹුරු අංක 298482 සහ 174579 හි කැබලි අංක 5 සහ මූලික පිඹුරු අංක මඩ/3017 හා කැබලි අංක 6 සහ තලවයිකාඩු ඉඩම

EOG 1-0157

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.